# ප්‍රසම්පාදන දැන්වීමයි.

## බලංගොඩ නගර සභාව - බලංගොඩ

01.පහත සඳහන් වැඩ විෂය සඳහා බලංගොඩ නගර සභාවේ ප්‍රසම්පාදන කමිටු සභාපති වන මා විසින් සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් වෙන් වෙන් වශයෙන් මුද්‍රා තබන ලද මිළ ගණන් කැඳවනු ලැබේ.

| අනු අංකය | වැඩ විස්තරය | ලියාපදිංචි ශ්‍රේණිය/ක්ෂේත්‍රය | ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තු (රු) | ආපසු ගෙවනු ලබන ලංසු බැඳුම්කර (රු) | කොන්ත්‍රාත්තුවේ ඇස්තමේන්තු ගත වටිනාකම (රු මි) |
|---|---|---|---|---|---|
| 01. | දෙහිගස්තලාව මුස්ලිම් සුසාන භූමිය අසලින් දිවෙන F H මාවත සංවර්ධනය කිරීම | C9 සහ ඉහළ මාර්ග | 3,000.00 | 53,000.00 | 4.2 |

02.මෙම ලංසු කැඳවීම ජාතික තරඟකාරී ක්‍රියා පටිපාටිය යටතේ සිදු කරනු ලබන අතර, මෙම කර්මාන්තයට අදාළ CIDA ශ්‍රේණිගත ප්‍රමුඛතාවය හෝ සබරගමු පළාත් ඉදි කිරීම් කොන්ත්‍රාත් ලියාපදිංචිය පදනම් කර ගනිමින් ලංසුකරුවන් තෝරා ගැනීම සිදු කරනු ලබයි.

03.ඉහත වැඩ විෂයට අදාළ ලංසුපත් **2026.07.28** දින සිට **2026.08.10** දින දක්වා සතියේ වැඩ කරන දිනයන්හි පෙ.ව.**9.00** සිට ප.ව. **3.00** දක්වා ඉහත සඳහන් පරිදි ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තු බලංගොඩ නගර සභාවට මුදලින් ගෙවා ලබා ගත හැකිය.

04.සියළුම ලංසුකරුවන් ඉදි කිරීම් සඳහා එම කර්මාන්ත ඉදිරියෙන් ඉහත සඳහන් ලංසු බැඳුම්කර වටිනාකමට අදාළව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිළිගත් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වාණිජ බැංකුවකින් 2026.08.11 දින සිට 2026.10.26 දක්වා වලංගු වන පරිදි බලංගොඩ නගර සභාවේ සභාපති විසින් නියෝග කළ වහාම කොන්දේසි විරහිතව මුදල් බවට පත් කරවා ගත හැකි (Unconditional On Demand Bank Guarantee) බැංකු ඇපකරයක් සභාපති, නගර සභාව බලංගොඩ නමින් හෝ බලංගොඩ නගර සභාවේ මුදල් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිවල මුල් පිටපත සෙසු ලංසු ලේඛනවල මුල් පිටපත් සමඟ ඉදිරිපත් කළ යුතුය. සියලුම ලංසු 2026.09.28 දින දක්වා වලංගු විය යුතුය.

05.ඉහත ඉදි කිරීම් පිළිබඳ විස්තර බළන්ගොඩ නගර සභාවේ කාර්යාල වේලාවන් තුළදී දැන ගත හැකිය. (045-4935781)

06.සාර්ථක ලංසු කරුවන්ට කොන්ත්‍රාත් පිරිනැමීම ඔවුන්ගේ ලියාපදිංචි වටිනාකමට සීමා කරනු ඇත. ලංසු සම්පූර්ණයෙන් හෝ භාගික වශයෙන් ප්‍රතික්ෂේප කිරීමේ හෝ භාර ගැනීමේ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතු වේ. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07.ලංසු පිටපත් දෙකකින් යුතුව 2026.08.11 දින පෙ.ව.11.00 දක්වා බළන්ගොඩ නගර සභාවේ තබා ඇති මුද්‍රා තබන ලද ටෙන්ඩර් පෙට්ටියට ගෙනවිත් බහාලීමෙන් හෝ ප්‍රසම්පාදන කමිටු සභාපති,නගර සභාව,බලංගොඩ නමට ලියාපදිංචි තැපැලෙන් එවීමෙන් ඉදිරිපත් කළ හැකිය. මුල් ලංසුපත හා පිටපත ලෙස නම් කර කවරවල බහා වෙන් වෙන්ව මුද්‍රා කර නැවත එක් කවරයක බහා මුද්‍රා තබා ඉදිරිපත් කළ යුතුය.

08.2026.08.11 දින පෙ.ව. 11.00 ට ලංසු භාර ගෙන අවසන් වූ වහාම බළන්ගොඩ නගර සභාවේදී ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ඇත. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගි විය හැකිය.

2026.07.27 දින ,

සභාපති,
ප්‍රසම්පාදන කමිටුව,
බලංගොඩ නගර සභාව ,
බලංගොඩ.

CS CamScanner